# ඉකුත් ජනපතිවරණයේදී නීති උල්ලංඝනය කළ අයට එරෙහිව අපරාධ නීතිය අනුව පියවර ගන්න
## ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්

මව්බිම

**ස්ටැන්ලි සමරසිංහ**

පසුගිය ජනාධිපතිවරණ සමයේදී මැතිවරණ නීති උල්ලංඝනය කළ අයට එරෙහිව විනයානුකූල සහ අපරාධ නීති අනුව පියවර ගැනීමට අදාළ බලධාරීන්ට නියම කරන්නැයි ඉල්ලා සාධාරණ සහ නිදහස් මැතිවරණයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළේය.

එම ව්‍යාපාරයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා ගොනු කළ මෙම පෙත්සමෙන් මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්, පොලිස්පති එන්. කේ. ඉලංගකෝන්, මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්, විගණකාධිපති, හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග සහ නීතිපතිවරයා වගඋත්තරකරුවන් ලෙස නම් කොට තිබේ.

මහජන දේපොළ පාවිච්චිය, මහජන දේපොළ අහිමි ලෙස යෙදීම සහ නාස්ති කිරීම, අදාළ බලධාරීන් මේ පිළිබඳව ඔවුන්ට පැවරී ඇති රාජකාරි අනුව මහජන දේපොළ සම්බන්ධයෙන් කටයුතු නොකිරීම පිළිබඳ පසුගිය ජනාධිපතිවරණයට අදාළව සිදුවූ සිද්ධීන් සම්බන්ධයෙන් අධිකරණයේ නියමයන් දැනගැනීමටද පෙත්සම්කරු මෙම පෙත්සමෙන් අපේක්ෂා කරයි.

මැතිවරණ කොමසාරිස්වරයා, ජනාධිපතිවරණයේදී මැතිවරණ නීති උල්ලංඝනය වීම වැළැක්වීම සඳහා රාජ්‍ය නිලධාරීන් ඇතුළු සැම දෙනාටම උපමාන සහ උපදෙස් ලබාදී තිබිණි. ඒ සියල්ලම නොතකා එක් අපේක්ෂකයකුගේ වාසිය පතා සිල් රෙදි බෙදාදීම, රට පුරා ලක්ෂ 8කට පමණ සිදු කර තිබෙන බව පෙත්සමේ සඳහන්වේ.

ලිත් බෙදීම, රජයේ සේවකයන් මැතිවරණ ව්‍යාපාරයට යොදා ගැනීම, මැතිවරණ සමයේ වාසි ලබා ගැනීම සඳහා ව්‍යාපෘති ඇරැඹීම, රජයේ සේවකයන්ට බලපෑම් කිරීම වැනි සිද්ධීන් නිසා පෙත්සම්කරුගේ මූලික අයිතීන් අහිමි වූ බව පෙත්සම්කරු පෙන්වා දෙයි.

මෙලෙස මැතිවරණ වැරැදි කළ අයට ගනු ලැබූ පියවරයන් පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා ගනු ලැබූ තීරණය පිළිබඳවද වාර්තා කරන ලෙස නියම කරන ලෙස පෙත්සම්කරු අධිකරණයෙන් ඉල්ලා සිටියි.